06 පාඩම

# සුනාමියට හසු වූ මුහුදු වෙළෙන්දෝ

## සමුද්ද වාණිජ ජාතකය

ලක්දිව කැලණිතිස්ස රාජ්‍ය සමයෙහි සිදු වූ මුහුද ගොඩගැලීමක් ගැන මහාවංසයෙහි සඳහන් ය. වැරදි සැකයක් නිසා රහතන් වහන්සේ නමක උණු තෙල් කටාරමක ගිල්වා මරා මුහුදට දැමූ මහා පාප කර්මයෙන් කුපිත වූ දෙවියන් මුහුද ගොඩගලන්නට සැලැස් වූ බව එම ඉතිහාස කතා පුවතෙන් කියවෙයි.

මෙවැනි ඉතිහාස පුවත් මගින් මුහුද ගොඩගැලීම ගැන අසා තිබුණ ද ශ්‍රී ලංකාවාසී අපට එය ආගන්තුක දෙයක්ව පැවතිණ. එහි බිහිසුණුකම සියැසින් ම දැක ගැන්මට ලැබුණේ 2004 වසරේ උඳුවප් පොහොය දිනෙක ඇති වූ සුනාමි ව්‍යසනය ලංකාවට බලපෑම් එල්ල කළ දිනයේ ය.

මිනිසුන්ගේ විෂම හැසිරීමක් හේතුවෙන් පසළොස්වක පොහෝ දිනෙක සඳ මුදුන් වූ අවස්ථාවක සිදු වූ එවන් සුනාමි ව්‍යසනයක් ගැන සමුද්ද වාණිජ ජාතකයෙන් කියවෙයි.

## වර්තමාන කතාව

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත තෙරුන් නිමිති කොටගෙන මෙම ජාතක කතාව වදාළ සේක. සැරියුත්-මුගලන් මහරහතන් වහන්සේලා දෙනම දෙව්දත් තෙරුන් ළඟ සිටි අනුගාමික පන්සියයක් වූ වැරදි මග ගත් භික්ෂූන්ට බණ කියා නිවැරදි මගට ගත් හ.

එයින් කුපිත වූ දේවදත්ත පාක්ෂික කෝකාලික තෙර දෙව්දත් තෙරුන් නිදා සිටින විට ''**තා මර නින්දේ ද?**'' කියා විලුඹෙන් පපුවට ඇන්න විට දෙව්දත් තෙරුන් ලේ වමනය කළේ ය. එයින් රෝගීව ඇඳේ වැතිර සිටින විට දෙව්දත් තෙරුන්ට මෙවැනි අදහසක් පහළ වුණි.

''මම නව මසක් ම කිසි පිහිටක් නැතිව අසරණ වූයෙමි. බුදුරජාණන් වහන්සේ මා කෙරෙහි කළකිරුණු සේක. අසූ මහා සව්වන් වහන්සේත් මාගේ බෑණා වූ රාහුල තෙරුන් වහන්සේත් මා කෙරෙහි කළකිරුණු සේක. මාගේ ශාක්‍ය-කෝලිය වංශික නෑයෝත් මා සමග අමනාප වූහ. කවුරුන් මා කෙරෙහි අමනාප වුවත් මාගේ බුදු රජාණන් වහන්සේ මා හා අමනාප නොවන සේක. මම බුදුන් සරණ යමි. බුදුරදුන් දැක ක්ෂමා කරවා ගනිමි''.

මෙසේ සිතා ළඟ සිටි භික්ෂූන්ට කතා කොට ඇඳ පිටින්ම ඔසවා ගෙන දෙව්රම් වෙහෙරට ගෙන යන්නැයි පැවසීය. දෙව්දත් තෙරුන් ඇතුලු පිරිස දෙව්රම් වෙහෙර බලා පිටත් වූ බව දැනගත් ආනන්ද තෙරණුවෝ බුදුරදුන්ට ඒ බව දැන්වූහ. එවිට බුදුරදුන් වදාළේ දෙව්දත් තෙරුන්ට මා දැකිය නොහැකි ය යනුවෙනි. දෙව්දත් තෙරුන් ක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණියේ ය. ඒ පුවත ද ආනන්ද හිමියෝ බුදුරදුන්ට සැල කළ හ. එහි දී ද බුදුරදුන් වදාළේ දෙව්රම් වෙහෙරට පැමිණියත් තමන් වහන්සේ දැකිය නොහැකි බව යි. දෙව්දත් තෙර දෙව්රම් වෙහෙර දොරටුවට ඔසවාගෙන ආ විට ඇඟෙහි දැවිල්ලක් ඇති වී දහඩිය ගලන්නට විය. ඒ දොරටුව අසල පොකුණක් ඇත. ''ඒ පොකුණෙන් දිය නා ගෙන යමි''යි සිතූ දෙව්දත් තෙර ඇඳ බිමින් තබවාගෙන පය බිම තැබී ය. එවිට පොළොව පැලී නරකයෙන් ගිනි දැල් පැමිණ සිවුරකින් සිවුරක් වසන්නා සේ සිරුර ගින්නෙන් වසා පොළොවෙහි ගිලෙන්නට ගත්තේ ය. බෙල්ල දක්වා ගිලුණු පසු ''මට බුදුරදුන් ගේ පිහිට මිස වෙනත් පිහිටක් නැතැ''යි බුදුන් සරණ ගියේ ය. එසේ බුදු සරණ යමින් අවීචියෙහි වැටුණේ ය. දෙව්දත් තෙරුන්ට පක්ෂපාතීව බුදුරදුන්ට නොයෙක් දොස් නැගූ පන්සියයක් මිනිස්සු ද එවේලෙහි අවීචියට ම ගිය හ. මෙම පුවත දම් සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් වහන්සේලා කතා කරමින් හුන් හ. එතැනට වැඩම කළ බුදුරදුන් එම තොරතුරු අසා ''මහණෙනි, දැන් පමණක් නොව පෙරත් තමන් හා එක්ව සිටි අය ද සමග දෙව්දත් නරකයට ගියහ'' යි වදාළ සේක.

## අතීත කතාව

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රාජ්‍ය සමයෙහි එක් ගමක වඩු ශිල්පීහු දහසක් සිටිය හ. එම වඩුවෝ ඒ ගමේ මිනිසුන්ට ඇඳ, පුටු, ගෙවල්, දොරවල් සාදා දෙමු යි, කියා අවශ්‍ය භාණ්ඩ හා මුදල් ඔවුන්ගෙන් ලබා ගත් හ. එහෙත් එම කාර්යයන් කර නොදුන් හ. වඩුවන් තමන්ට වුවමනා දේ සාදා නොදෙන හෙයින් මිනිස්සු ''අපගෙන් ගත් මුදල් දෙව''යි කීහ. එහෙත් වඩුවන්ට එම මුදල් ගෙවාගන්නට නොහැකි විය. ඔවුහු වඩු කර්මාන්ත ද නොකරන්නාහු ය. මෙසේ කිසිත් කර ගන්නට නොහැකි වූ ඔවුහු කණගාටුවට පත්ව වනාන්තරයට ගොස් මහා යාත්‍රාවක් සෑදූ හ. එය ගඟ දිගේ ගෙනවුත් තමන්ගේ අඹු දරුවන් ද එම යාත්‍රාවට නංවා ගත් වඩුවන් දහසක් දෙනා ගඟ දිගේ යාත්‍රා කොට මුහුදට පැමිණියාහු ය. මුහුදේ යාත්‍රා කරන ඔවුහු මිහිරි අඹ, කෙසෙල්, උක් දඬු, වැළ වරකා, ස්වයංජාත හැල් ආදී මිහිරි රසවත් පළතුරුවලින් පිරුණු දූපතක් දුටුවහ. එම දූපත මිනිසුන් වසන දූපතක් දැයි, විමසා බැලීමට ශක්තිමත් පුරුෂයන් සත් දෙනෙකු ආයුධ ද සහිතව එහි යැවූ හ.

එම දූපතට ඔවුන්ට පෙර එක්තරා මිනිසෙකු ගොඩබැස සුවසේ කැමති පරිදි ඇල් හාලේ බත් කා, උක් පැණි බී රිදී පටක් වැනි වූ වැල්ලේ වැතිරී මෙසේ කල්පනා කොට ඇත. ''මට ඇති මෙම සැප ඇත්තේ වෙන කවුරුන්ට ද? අඩුවකට ඇත්තේ වස්ත්‍ර නැති බව පමණකි. දඹදිව බොහෝ මිනිස්සු ජීවත්වීමට සී සෑම්, වැපිරීම් ආදිය කොට දුක් විඳින්නා හ. මට එවැනි වූ වෙහෙසක් නැත'' සිතමින් එහිම නතර විය. දූපත පරීක්ෂා කිරීමට පැමිණි පුරුෂයන් සත් දෙන ඔහු වැතිර සිටි තැනට ගොස් යකෙක් වේ යැයි, සිතා විදින්නට සූදානම් වූහ. එවිට එම

මිනිසා, ''මට විදින්න එපා. මම යක්ෂයෙක් නො වෙමි.''යි කීය. එවිට පුරුෂයෝ සත් දෙනා ''මිනිසෙකු වූයේ නම් නිරුවත්ව හිඳී ද? කෙස් රැවුල් වවාගෙන මෙසේ සිටින්නේ ඇයි ද'යි, කීහ. එවිට මිනිසා ''යාත්‍රාවක නැගී ආ මම මෙතැන නතර වුණෙමි.'', යි කීවේ ය. පුරුෂයන් සත්දෙනා ඔහුගෙන් ''මෙතැන ඇති සැප පහසුකම් මොනවා ද''යි විචාළහ. එවිට එම මිනිසා මෙසේ කීවේ ය.

''මෙතැනට වඩා පළතුරු ආදිය ඇති තැනක් ද සිත් ඇදගන්නා තැනක් ද, යක් රකුසු බිය නැති තැනක් ද වෙනත් නැත. තොප සැමදෙනා ම කළ යුත්තක් ඇත. මෙතැන ඉතා සිත් අලවන තැනක් හෙයින් දේවතාවෝ මෙතැනට ඇලෙන්නා හ. ඒ නිසා එළියෙහි මලමුත්‍ර පහ නොකොට වළක් හාරා, එහි මළමුත්‍ර පහ කරව. එය පමණක් කරගත හැකි වුවහොත් මීට වඩා සැප පහසු ඇති වෙයි. වෙනත් තැනක් නැත.''

මෙය ඇසූ එම පුරුෂයෝ සත්දෙනා නැවට නැගී වඩුවන් දහසත් තමන්ගේ අඹු දරුවනුත් නැවෙන් ගොඩ බස්සවා ඒ දූපතේ ගෙවල් ඉදිකර වූහ. සැප සේ ස්වයංජාත හැල් ද මිහිරි පළතුරු ද කා වාසය කළ හ.

මේ පිරිස අතර එම වඩුවන් දහසට නායක වූ දෙදෙනෙකු ඇත. එක් වඩු නායකයෙක් හා පන්සියයක් වඩුවෝත් ලද පමණින් සතුටුවන ගුණයෙන් යුක්තය හ. එක් වඩු නායකයෙක් හා පන්සියයක් වඩුවෝ තෘෂ්ණාවෙන් යුක්තය හ. වීර්‍ය ද ඒ අයුරින් ම දෙකට බෙදාගෙන වාසය කරන්නට පටන් ගෙන ''බොහෝ දවස් අපි රා නොබී සිටියෙමු'' යි කියා උක් පැණියෙන් රා පෙරා බී මත් වී නොයෙක් තැන මළමුත්‍ර පහ කොට අපවිත්‍ර කළ හ.

ඉක්බිති දේවතාවෝ මෙසේ සිතූහ. ''අපගේ මෙම සිත් ඇදගන්නා වූ ස්ථානයෙහි මොවුහු මළමුත්‍ර කළහ. සමුද්‍රයෙන් ජලය නගාලමු''. පසුව දේවතාවෝ ''පසළොස්වක පොහොය දා පුන් සඳ මුදුන් වූ විට ජලය නංවමු'' යි කතා කරගත් හ. ඒ අතර සිටි එක්තරා දෙවියෙක් මා වැනි කෙනෙකු සිටිය දී මේ මිනිසුන් නොනසත්වා යි, සිතා සියලු ආභරණයෙන් සැරසී උතුරු දිසාවේ සිට ආලෝකය විහිදුවා මෙසේ කීහ.

''එම්බා පුරුෂයෙනි, මේ දූපත මළමුත්‍ර කොට අපිරිසිදු කොට ඇති බැවින් මුහුද ගලා දූපත යට කරන්නට දේවතාවෝ එකතුව කතා කළ හ. ඒ නිසා තෙපි සැමදෙනම වෙන තැනකට යවු''

ඊට පසු තවත් දේවතාවෙක් සියලු ආභරණයෙන් සැරසී දකුණු දිසාවේ සිට,

''තොප හැම ළඟට දේවතාවෙක් පැමිණ කීවේ බොරු ය. තෙපි හැම මෙහිම සිත් අලවා වාසය කරව. මුහුදු ජලය ගලා කවදා මේ දූපත ගිලෙන්නේ ද? ඒ බොරු ය. මෙහි ම වාසය කරව'' යි, කියා ගිය හ. එම දේවතාවා ගිය පසු දූපත කෙලෙසූ වඩු නායකයා ''පළමු දේවතාවා අප මෙහි වසනවාට නොකැමති ය. පසුව ආ දේවතාවා කී දෙය ඇත්ත ය. ඒ නිසා අපිත්. තෙපිත් නොගොස් මෙහිම ඉඳිමු'' යි කීය.

නුවණැති වඩු නායකයා තම පිරිස කැඳවා මෙසේ උපදෙස් දුන්නේ ය. ''එක් දේවතාවෙක් යන්නට කීහ. එක් දේවතාවෙක් නවතින්නට කීහ. මේ දෙදෙනා කී දෙයින් කුමක් ඇත්ත ද යි, කුමක් බොරු ද යි, නො දනෙයි. අප නැසෙන්නේ කුමකට ද? යාත්‍රාවක් සාදා තබා මුහුදු දිය මෙතැනට ගලා ඒ නම් යාත්‍රාවට නැගී යමු. නොගලන්නේ නම් මෙතැනම හිඳිමු. ඒ නිසා යාත්‍රාවක් සාදා තබමු යි, යාත්‍රා සාදවා ඒවාට රිටි ආදිය ද සකස් කොට තබා ගත් හ.

අනෙක් වඩු නායකයා තම පිරිසට කතා කොට ''තලියේ කිඹුලන් ඇතැ යි, බිය වන්නේ කුමට ද'' යි කීය. පසළොස්වක පොහොය දිනය උදා වී සඳ පෑයූ විට මුහුදු රළ දූපතට ගලාගෙන ඇවිත් දණක් පමණ උසට දිය පිරී ගියේ ය. එවිට නුවණැති වඩුවාණෝ තමන්ගේ පන්සියයක් වඩුවනුත් සමග යාත්‍රාවලට නැගී පිටත්ව ගිය හ. අනෙක් නායක වඩුවා ''දැන් එන රළ ගණන් නොගෙන මෙතන ඉඳිමු. කුණු සෝදාගෙන ගලා ගියේ යැ''යි කියා නතර වී සිටියේ ය. ඊළඟට උකුළක් පමණ, පපුව පමණ, කරවටක් පමණ මුහුදු දියෙන් පිරී, පන්සියයක් වඩුවෝත් අඹු දරුවෝත් මුහුදු දියෙන් ම යට වී මළා හ. නුවණැති වඩුවා ද පන්සියයක් වඩුවෝ ද සුව සේ නැව් නැගී ගොස් ගැලවුණාහ.

එදා දූපත හැර නොයන ලෙස බොරු කී දේවතාවා කෝකාලික භික්ෂුව ය. දූපත හැර වෙන තැනෙකට යන්නට කී දේවතාවා සැරියුත් මහ තෙරණුවෝ ය. එදා අනුවණ වඩුවා දෙව්දත් තෙර ය. යාත්‍රාවට නැගී දූපතෙන් පිටත්ව ගිය වඩුවෝ පන්සියය බුදු පිරිස ය. එදා පණ්ඩිත වඩුවාණෝ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ම වූ සේක.

**අභ්‍යාස**

01. දෙව්දත් තෙර අවීචි මහා නරකයට ඇද ගෙන යන අවස්ථාවේ ඔබ සිටියේ යැයි, සිතා ''දෙව්දත් තෙර දෙව්රමෙන් අවීචියට...'' යන ශීර්ෂ පාඨයෙන් පුවත්පත් වාර්තාවක් ලියන්න.
02. සමුද්‍ර වාණිජ ජාතකය පන්තිය ඉදිරියේ ප්‍රකාශ කරන්න.
03. මිනිසුන් නොමග යැවූ දේවතාවා වැනි අසත්‍යය සමාජය තුළ පතුරුවන්නන් ගෙන් වන හානිය උග්‍ර සමාජ ව්‍යසනයක් වී තිබේ. මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

**භාවිතයට**

ඉමෙහි අට්ඨහි තමග්ග පුග්ගලං
දෙවාති දෙවං නරදම්ම සාරථිං
සමන්ත චක්ඛුං සත පුඤ්ඤ ලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං උපෙමි